www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එල්ටීටීඊ නායකයා "ලෝක බලවතුන්ට" මංමුලා සහගත ආයාචනයක් කරයි

## LTTE leader makes desperate appeal to "world powers"

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2007 දෙසැම්බර් 12**

දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ වාර්ෂික "මහා වීර දින" කතාව එම සංවිධානයේ දේශපාලන බංකොලොත්කම හා ගැඹුරු වන අර්බුදය පිලිබඳ තවත් සලකුනකි. එහි කේන්ද්‍රීය තල්ලුව වූයේ එල්ටීටීඊය විනාශ කිරිමේ ශ්‍රී ලංකා ආන්ඩුවේ යලි ඇරඹූ යුද්ධයට පිටුබලය දෙමින් සිටින එම ජාත්‍යන්තර බලවතුන්ට ම මංමුල සහගත ලෙස ආයාචනා කිරීමකි.

එල්ටීටීඊයේ උතුරුදිග බල මධ්‍යස්ථානවලට එරෙහිව ශ්‍රී ලංකා ආන්ඩුව ගෙන යන මිලිටරි මෙහෙයුම් මධ්‍යයේ නොවැම්බර් 27 දා එම කතාව පවත්වන ලදි. ඊට පෙර දින, ශ්‍රී ලංකා ජනාධිපතිගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ප්‍රකෝපකාරී ලෙස ප්‍රකාශ කර සිටියේ, පසුගිය මාසයේ ඉලක්ක කොට එල්ල කෙරුනු ගුවන් ප්‍රහාරයක දී එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු එස්.පී. තමිල්චෙල්වම් ඝාතනය කල ආකාරයට ම මිලිටරිය ප්‍රභාකරන් ද මරා දමන බව යි.

2005 නොවැම්බරයේ දී ජනාධිපති මහින්ද රාජපක්ෂ යන්තමින් මැතිවරනය ජය ගෙන බලයට පත් වීමෙන් පසුව, මිලිටරිය රටේ දිග්ගැසුනු සිවිල් යුද්ධය යලි අරඹා ඇත. ප්‍රකෝපකාරී ඝාතන හා පැහැර ගැනීම් මාලාවක් පලමුව සිදු වූ අතර අනතුරුව 2006 ජුලි මසට පසුව, 2002 සටන් විරාම ගිවිසුම විවෘතව උල්ලංඝනය කරමින් මිලිටරි ප්‍රහාරයන් දියත් කෙරුනි. අඩු ගනනේ ජීවිත 5,000ක් වත් බිලිගත් හා 200,000කට වැඩි ජනයාට උන් හිටි තැන් අහිමි කල මෙහෙයුම් මගින් නැගෙනහිර පලාතේ සියලු එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශ තමන් අල්ලා ගෙන ඇතැයි හමුදාව දැන් කියාපායි.

පසුගිය වසර දෙකක කාලය මුලුල්ලේ, ජාත්‍යන්තර "සාම ක්‍රියාදාමය" අධීක්ෂනය කරන රටවල් -- එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ -- යලි ඇරඹූ යුද්ධයට තථ්‍ය වසයෙන් ම සහයෝගය දී ඇත. සාම සාකච්ඡා යලි අරඹන ලෙස විටින් විට ආයාචනා කරමින් ද ශ්‍රී ලංකා බලධාරින්ගේ විවෘත උල්ලංඝනයන් පිලිබඳව විටින් විට විවේචන කරමින් ද සිටින මහ බලවත්තු මිලිටරියේ ප්‍රහාරක මෙහෙයුම් ඉදිරියේ ඇස් පියාගෙන සිටිති. විශේෂයෙන් ම එක්සත් ජනපදය ශ්‍රී ලංකා මිලිටරියට පුහුනුව හා ආධාර සැපයීම දිගට ම කරගෙන යයි.

සිය කතාව තුල දී, ප්‍රභාකරන් යුද්ධය යලි ඇරඹීම ගැන රාජපක්ෂ ආන්ඩුවට බැන වැදුනේ ය. "ජාත්‍යන්තර ප්‍රජාවේ පක්ෂග්‍රාහී හා අයුක්තිසහගත ක්‍රියාකලාපය . . . සටන් විරාමය හා සාම ප්‍රයත්නයන් බිඳ වැටීමට පාර කපා" ඇතැයි වැලපුනු ඔහු "ඔවුන් සිංහල රාජ්‍යයට සපයා ඇති නොමසුරු මිලිටරි හා ආර්ථික ආධාර ද ස්වෝත්තමවාදී සිංහල රාජ්‍යයට මුක්කු ගැසීමේ ඔවුන්ගේ රාජ්‍යතාන්ත්‍රික ප්‍රයත්නයන් ද සිය මිලිටරිවාදී මාවත ඔස්සේ යාමෙහි ලා සිංහල ජාතිය තව දුරටත් දිරිමත් කර තිබේ" යැයි ද සඳහන් කලේ ය.

"ජාත්‍යන්තර ප්‍රජාව" ගැන ප්‍රභාකරන් කරන විවේචන වෛරයෙන් කරනාවට වඩා ශෝකයකින් කරන ඒවා ය. ශ්‍රී ලාංකික දෙමල ජනයාගේ අභිලාෂයන් සපුරාලීමට අපොහොසත් වූ 1987 ඉන්දු-ලංකා ගිවිසුම පටවනු පිනිස 100,000ක ඉන්දියානු සාම සාධක හමුදා එවමින් ඉන්දියාව කල "වරද" ම මහ බලවතුන් කරන බවට ද ඔහු පැමිනිලි කලේ ය. "ජාත්‍යන්තර ප්‍රජාව" කොලඹ ආන්ඩුවට දෙන සිය ආධාර නතර කොට "දෙමල ජාතියේ ස්වයං-නිර්න අයිතිය හා ස්වෛරී භාවය පිලිගනු" ඇතැයි යන "බලාපොරොත්තුව" ප්‍රභාකරන් නැවත නැවතත් අවධාරනය කලේ ය.

ප්‍රභාකරන්ගේ අදහස් දැක්වීම් යලිත් පෙන්නුම් කරන්නේ, ශ්‍රී ලංකාවේ උතුරේ හා නැගෙනහිර ධනපති වැයික්කියක් සඳහා වූ සිය ව්‍යාපෘතිය වෙනුවෙන් මහ බලවතුන් එක අයකුගේ හෝ ඊට වැඩි ගනනකගේ පිටුබලය ලබා ගැනීමේ බලාපොරොත්තුව මත එල්ටීටීඊයේ ඉදිරිදර්ශනය ආරම්භයේ පටන් ම පාදක වී ඇති බවයි. 1980 ගනන්වල දී වෙනම දෙමල ඊලමක් සඳහා ඉන්දියාවේ සහයෝගය ලබා ගැනීම ගැන එල්ටීටීඊය බලාපොරොත්තු තබා තිබූනි යන කාරනාවට ප්‍රභාකරන් කිසිදු සැඳහුමක් නොකරයි. එල්ටීටීඊය ඉන්දු-ලංකා ගිවිසුමට එකඟ වූ අතර එය නව දිල්ලියට එරෙහිව යාමට හැරුනේ එල්ටීටීඊයට සැලකිය යුතු දේශපාලන ක්‍රියාකලාපයක් සඳහා අවසර දීමේ කිසිදු අභිප්‍රායක් ඉන්දියාවට නැති බව පැහැදිලි වීමෙන් පසුව පමනි.

2002 සටන් විරාමය අත්සන් කිරීම සිදු වූයේ එක්සත් ජනපදයට එල්ල වූ සැප්තැම්බර් 11 ප්‍රහාරයෙන් ඉක්බිතිව ය. කොලඹ පාලන ප්‍රභූවේ කොටස්, තමන්ට වාසි සහගත කොන්දේසි මත එල්ටීටීඊය සාකච්ඡා මේසයට තල්ලු කර ගැනීමට බුෂ් පාලනාධිකාරයේ “ත්‍රස්ත විරෝධී යුද්ධය” ගසා කා හැකි යැයි නිගමනය කලේ ය. 2002 දී ඇරඹුනු සාම සාකච්ඡා තුල දී, එල්ටීටීඊය වෙනම රාජ්‍යයක් පිලිබඳ සිය දිගු කාලීන ඉල්ලීම අතහැර දමා “ව්‍යාඝ්‍ර ආර්ථිකයක්” නිර්මානය කිරීමෙහි ලා එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයෙන් යුත් ආන්ඩුව සමග සහයෝගීව වැඩ කිරීමට පොරොන්දු විය. රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සහ 2005 ජනාධිපතිවරනයේ දී රාජපක්ෂට පිටුබලය සැපයූ සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ඇතුලු විපාර්ශ්වික පක්ෂ සිදු කල හෙලාදැකීම් මධ්‍යයේ සාකච්ඡා බිඳ වැටුනි.

යුද්ධය යලි ඇරඹීමට ප්‍රභාකරන්ගේ ප්‍රතිචාරය වී ඇත්තේ, “ජාත්‍යන්තර සහයෝගය” වෙනුවෙන් නිවට ආයාචනයක් කිරීම යි. “ලෝක බලවතුන්ගේ මිලිටරි, ආර්ථික හා භූ-දේශපාලනික අවශ්‍යතා අපගේ කලාපය තුල දෘඩතරව මුල් බැස ගෙන ඇති බව අපි ඉතා හොඳින් දනිමු.” යයි ඔහු ප්‍රකාශ කලේ ය. “සිය අවශ්‍යතා ඉදිරියට ගෙන යාමේ ඔවුන්ගේ උත්සුකතා ගැන අපි අවබෝධයෙන් සිටිමු. එම හේතු නිසා ම මේ දිවයිනට ස්ථාවරත්වය හා යහ පාලනය ගෙන ඒමට ජාත්‍යන්තර ප්‍රජාවට පවත්නා උත්සුකතා ද අපි හඳුනාගෙන සිටිමු.”

මෙම ප්‍රකාශ වනාහි, මහ බලවතුන්ගේ, විශේෂයෙන් ම එක්සත් ජනපදයේ, අවශ්‍යතා ගැන එල්ටීටීඊය අවබෝධයෙන් සිටින බවත් තමන්ට දේශපාලන පිලිගැනීමක් ලබා දීමට හිලව් වසයෙන් එම අවශ්‍යතාවන්ට ඉඩ දීමට තමන් උවමනාවටත් වඩා සූදානම් බවත් කියා සිටීමකි. “ස්ථාවරත්වයේ හා යහ පාලනයේ” අවශ්‍යතාව එල්ටීටීඊය පිලිගෙන ඇත්තේ, කලාපය තුල, විශේෂයෙන් ම ලාභ, පුහුනු ශ්‍රම උල්පතක් ලෙස මහා සංගත විශාල වසයෙන් රදා පවත්නා ඉන්දියාව තුල, යුද්ධය විසින් ඇති කරනු ලබන අස්ථාවරකරන බලපෑම ගැන පවතින ජාත්‍යන්තර උත්සුකතාවන්ට ආමන්ත්‍රනය කිරීමට යි.

ඔවුන්ට සේවය කිරීමේ එල්ටීටීඊයේ සූදානම අවධාරනය කරනු වස්, ප්‍රභාකරන් ජාත්‍යන්තර ප්‍රජාවට තව දුරටත් ස්තෝත්‍ර ගායනා කරයි. “ලෝක බලවත්තු, ස්වකීය භූ-දේශපාලනික අවශ්‍යතා ඉදිරියට ගෙන යමින් පවා, මානව හිමිකම්වලට හා ප්‍රජාතාන්ත්‍රික ආයතනවලට ගරු කරති” යැයි ඔහු ප්‍රකාශ කලේ ය. “නැගෙනහිර ටිමෝරය හා මොන්ටිනීග්‍රෝ වැනි ජාතීන් ජාත්‍යන්තර ප්‍රජාවේ උදව් උපකාර ඇතිව සිය යටත් භාවයෙන් බිඳී වෙන් වී සිය නිදහස දිනා ගෙන ඇත්තේ මේ නිසා ය. මේ අවස්ථාවේ පවා, කොසොවෝ වැනි ජාතීන්ගේ නිදහස සඳහා ජාත්‍යන්තර ප්‍රජාව දිගට ම වැඩ කරගෙන යයි.”

ඉරාකය හා ඇෆ්ගනිස්ථානය තුල බුෂ් පාලනාධිකාරයේ සාපරාධී ක්‍රියාවන් මෙන් ම එක්සත් ජනපදයේ භූ-දේශපාලනික අවශ්‍යතා වෙනුවෙන් ඉරානයට එරෙහිව එය සිදු කරන යුද සූදානම ද නොතකා හැරීමට ප්‍රභාකරන් පෙන්නුම් කර ඇති කැමැත්ත මගින් පැහැදිලි කෙරෙන්නේ, ශ්‍රී ලංකාව තුල, ඔවුන්ට යම් ක්‍රියාකලාපයක්, එය සුලු ක්‍රියාකලාපයක් වුවත්, සහතික කර දීමට එල්ටීටීඊය නොකරනු ඇති දෙයක් නැති බව යි. ආර්ථිකව, දේශපාලනිකව හා මිලිටරිමය ලෙස එක්සත් ජනපදය හා එහි සගයන් මත මුලුමනින් ම රදා පවත්නා කුඩා ප්‍රාන්ත රාජ්‍යයන් තුනක් වන නැගෙනහිර ටිමෝරය, මොන්ටිනීග්‍රෝ හා කොසෝවෝ ගැන කරන සැඳහුම අවධාරනය කරන්නේ එම කාරනාව යි.

මේ එක් එක් රට තුල පවතින කොන්දේසි වැඩ කරන ජනතාව හමුවේ පරදුවට තබා ඇත්තේ කුමක්ද යන වග ද පැහැදිලි කරයි. නැගෙනහිර ටිමෝරය ලෝකයේ දුප්පත් ම රටවලින් එකක් ලෙස තවමත් පවතින අතර එහි ජනගහනයෙන් සියයට 40ක් නිදන්ගත මන්දපෝෂනයෙන් පෙලෙන බවට ද සියයට 10ක් සරනගත කඳවුරුවල දිවි ගෙවන බවට ද තක්සේරු කෙරෙයි. කොසෝවෝ හා මොන්ටිනීග්‍රෝ යන කුඩා බෝල්කන් වැයික්කි දෙක තුල ආධිපත්‍යය දරන්නේ, ඉහල මට්ටමක දරිද්‍රතාව හා විරැකියාව මත ලගින ජනවාර්ගික සුලුතරයන් වධ බන්ධනයට ලක් කිරීම සම්බන්ධයෙන් දේශපාලනිකව වගකිව යුතු දක්ෂිනාංශික බටහිර-පිටුබලය ලබන ආන්ඩු ය.

ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පලාත් සඳහා අධිරාජ්‍යවාදී අනුග්‍රහය යටතේ යම් ආකාරයක ස්වයං-පාලනයක් හෝ ස්වාධීනත්වයක් පිහිටුවීම, දෙමල පාලක ප්‍රභූවේ පටු වරප්‍රසාදිත ස්ථරයකට වාසි ලබා දෙනු ඇති අතර සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ දැවෙන අවශ්‍යතා හා ප්‍රජාතාන්ත්‍රික අභිලාෂයන් සපුරාලනු වස් කිසිවක් නොකරනු ඇත.

“දෙමල ජාතියට” හා “සිංහල ජාතියට” ප්‍රභාකරන් තිරන්තරයෙන් කරන සැඳහුම් එල්ටීටීඊ වැඩපිලිවෙලෙහි වර්ගෝත්තමවාදී ස්වභාවය අවධාරනය කරයි. එහි දෙමල බෙදුම්වාදය සේවය කරන්නේ කොලඹ දේශපාලන සංස්ථාපිතයේ සිංහල ස්වෝත්තමවාදය මෙන් ම එම සාරභූත පන්ති අරමුන සඳහා ම ය -- එනම්, කම්කරු පන්තිය හා ගම්බද දුගීන් ජනවාර්ගික රේඛා ඔස්සේ භේද කිරීම මගින් දෙමල හෝ සිංහල ධනේශ්වරයේ අවශ්‍යතා ආරක්ෂා කිරීම යි.

ප්‍රභාකරන් සහ එල්ටීටීඊය යලි ඇරඹූ යුද්ධය සම්බන්ධයෙන් සමස්තයක් ලෙස “සිංහල ජාතියට” බැන වදින්නේ, හරියට ම, සිංහල, දෙමල හා මුස්ලිම්

වැඩ කරන ජනතාවගේ පුලුල් ස්ථර යුද්ධයට ද ජීවන කොන්දේසි මත එය ඇති කරන බලපෑමට ද සතුරුව සිටින අවස්ථාවක ම ය. වැටුප් හා කොන්දේසි අරබයා වර්ජන හා විරෝධතා පැන නැගීම වඩ වඩා පොදු දෙයක් බවට පත්වෙමින් තිබේ. කෙසේ වෙතත්, එල්ටීටීඊය, ආන්ඩුවට හා යුද්ධයට එරෙහිව වැඩ කරන ජනතාවගේ ඒකාබද්ධ අරගලයක් සඳහා ආයාචනයක් කිරීමට ඓන්ද්‍රීයව අපොහොසත් ය.

රටේ සෑම ජනවර්ගයකට ම අයත් වැඩ කරන ජනතාව සටන් විරාමය බිඳ වැටීමෙන් ද යුද්ධය යලි ඇරඹීමෙන් ද “ලෝක බලවතුන්” එල්ටීටීඊය කරන බංකොලොත් ආයාචනාවලින් ද පාඩම් උකහා ගත යුත්තාහ. කම්කරුවන්ට සිය අවශ්‍යතා ඉදිරියට ගෙන යා හැක්කේ, සියලු ම රූපාකාරයේ ජාතිකවාදය, වර්ගවාදය හා ස්වෝත්තමවාදය ප්‍රතික්ෂේප කොට සිය පොදු පන්ති අවශ්‍යතා ආරක්ෂා කරගනු වස් ඒකාබද්ධ වීමෙන් පමනි.

අධිරාජ්‍යවාදී බලවතුන් හා ඔවුන්ගේ ඊනියා “සාම ක්‍රියාදාමයන්” මත කිසිදු විශ්වාසයක් තැබිය නොහැකි යැයි අවධාරනය කර ඇති එක ම පක්ෂය සමාජවාදී සමානතා පක්ෂය (සසප) යි. යුද්ධය හා සමාජ අසමානතාව අවසන් කිරීමේ ද සියල්ලන්ට ම අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සඳහා ද වූ දේශපාලන ප්‍රහාරයක් තුල වැඩ කරන ජනතාව ඒකාබද්ධ කිරීමේ විධික්‍රමයක් ලෙස දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් ශ්‍රී ලංකා මිලිටරිය වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙස අපි ඉල්ලා සිටිමු.

ධනවතුන් අතලොස්සකගේ ලාභ වෙනුවෙන් නොව බහුතරයක් ජනතාවගේ සමාජ අවශ්‍යතා සපුරාලනු පිනිස සමාජය ඉහල සිට පහලට ප්‍රතිසංවිධානය කරනු ඇති කම්කරු-ගොවි ආන්ඩුවක් සඳහා සසප සටන් වදී. දකුනු ආසියාව පුරා හා ජාත්‍යන්තරව සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා වූ වඩා පුලුල් අරගලයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් ගොඩනගන ලෙස අපි කැඳවුම් කරමු.

© www.wsws.org